# සුවිශේෂක මාක් මුනි
## මංගල්‍යය

## පළමුවන දේව ප්‍රකාශනය 1 පේදුරු 5: 5–14

*ශුද්ධවූ පේදුරුතුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"මාගේ පුත්‍ර මාක් ද ඔබට ආචාර කරයි"

තවද, තරුණයෙනි, සභා මූලිකයන්ට යටත් වන්න. ඔබ සියල්ලන් එකිනෙකා කෙරෙහි යටහත්කමින් සැරසී සිටින්න. මන්ද, දෙවියන් වහන්සේ උඩඟු අයට විරුද්ධ ව සිට යටහත් අයට කරුණාව දක්වන සේක. එබැවින් දෙවියන් වහන්සේ සුදුසු කාලයෙහි දී ඔබ උසස් කරනු පිණිස උන් වහන්සේගේ බලවත් හස්තයට යටත් වන්න. උන් වහන්සේ ඔබ ගැන සළකන හෙයින්, ඔබගේ හැම කරදරයක් ම උන් වහන්සේට භාර දෙන්න.

සිහිසන් ඇතිව අවදි ව ඉන්න. ඔබගේ විරුද්ධකාරයා වන යක්ෂයා, ගොරවන සිංහයෙකු මෙන් කවරෙකු ගිල ගනිම් දෝ හෝ යි සොයමින් ඔබ මොබ ඇවිදින්නේ ය. ලෝව පුරා සිටින ඔබගේ සහෝදරයන් එම දුක් කරදර වලට ම භාජනය වන බව ඔබ දන්නා බැවින්, ඔබගේ ඇදහිල්ලෙහි ස්ථිර ව සිට, යක්ෂයාට විරුද්ධ වන්න. එවිට ක්‍රිස්තුන් වහන්සේ මගින් ස්වකීය සදාතන තේජසට ඔබ කැඳවූ සියලු, වරප්‍රසාද දෙන දෙවියන් වහන්සේ ම ඔබ ස්වල්ප කලක් දුක් වින්ද පසු, ඔබ සම්පූර්ණ කර, ස්ථිර, ශක්තිමත් පදනමක් මත පිහිටුවන සේක. උන් වහන්සේට සදහට ම පරාක්‍රමය වේ වා! ආමේන්.

මේ ලුහුඬු හසුන, අපගේ විශ්වාස කටයුතු සහෝදරයෙකු වශයෙන් මා සළකන සිල්වානස්ගේ උපකාරයෙන් ලියා ඔහු අත ඔබ වෙත එවමි. එසේ එවන්නේ, ඔබ ධෛර්යයවත් කර මේ සියල්ල සත්‍යය දේව වරප්‍රසාදය බවට සාක්ෂි දෙන පිණිස ය. එහි ස්ථිර ව පිහිටා සිටින්න. ඔබ සමඟ තෝරා ගනු ලැබූ බබිලෝනියෙහි ඇති සභා තොමෝ ඔබට ආචාර කරන්නීය. මාගේ පුත්‍ර මාක් ද එසේ ම ඔබට ආචාර කරයි. ප්‍රේම සිඹීමකින් එකිනෙකාට ආචාර කරන්න. ක්‍රිස්තුන් වහන්සේට අයිති ඔබ සියල්ලන්ට සාමදානය වේ වා!

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 89:1–2, 5–6, 15–16

පිළිතුර: ඔබේ තිර පෙම ගැන මම සදහටම ගයන්නෙමි.

ගීය : සමිඳුනි, ඔබේ තිර පෙම ගැන මම සදහට ම ගයන්නෙමි.
ඔබේ විශ්වාසවන්තකම පරපුරෙන් පරපුරට පවසන්නෙමි.
ඔබේ තිර පෙම සදහට ම පවතින බව
මම ඒකාන්තයෙන් ම පිළිගනිමි:
ඔබේ විශ්වාසවන්තකම අහස මෙන් තිරසර බව මම දනිමි.

අහෝ සමිඳුනි! ඔබ කරන අසිරිමත් ක්‍රියා ගැන
අහස් තලය ගයන්නේ ය.
සුරලොව පිරිස් ඔබේ විශ්වාසවන්තකම ගැන
ගීතිකා කරන්නෝ ය.
සමිඳුන්ට සම කළහැකි කිසිවෙක් අහස් තලයෙහි ඇද් ද?
දෙවිවරුන් අතර සමිඳුන්ට සමාන වනුයේ කවරෙක් ද?

සමිඳුනි, ගී ගයමින් ඔබ නමදින්නෝ ද
ඔබේ කරුණා ආලෝකය තුළ හැසිරෙන්නෝ ද භාග්‍යවන්තයෝ ය.
දවස පුරා ඔව්හු ඔබ අභියස ප්‍රීති ප්‍රමෝද වන්නෝ ය:
ඔබේ දැහැමිකම ගැන වෙසෙසින් පසසන්නෝ ය.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
“අපි කුරුසියේ ඇණ ගසනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ දේශනා කරමු.
උන් වහන්සේ දෙවියන් වහන්සේගේ කාලය හා ප්‍රඥාව වේ.”
ආලේලූයා!

## සුවිශේෂය

මාක් 16: 15 – 20

*සුවිශේෂක මාක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"සකල සත්ත්වයා හට සුවිශේෂය දේශනා කරන්න."

ජේසුස් වහන්සේ ඔවුන් අමතා, "ලොව පුරා ගොස් සකල සත්ත්වයා හට සුබ අස්න දේශනා කරන්න. අදහා බව්තීස්ම–ස්නාපනය ලබන තැනැත්තේ ගැළවීම ලබන්නේ ය. එහෙත්, අදහා නොගත් තැනැත්තේ වරදකරු යයි තීන්දුව ලබන්නේ ය. අදහන්නන් ඇසුරු කොටගත් හාස්කම් මේ ය: ඔව්හු මාගේ නාමයෙන් දුෂ්ටාත්ම දුරු කරති: අමුතු භාෂා වලින් කතා කරති: සර්පයන් අතින් අල්ලාගනිති: යම් මාරක විෂක් බීවත් ඉන් කිසි අනතුරකට පත් නොවෙති: රෝගීන් පිට අත් තැබූ විට, ඔව්හු සුවය ලබති"යි වදාළ සේක.

මෙසේ ජේසුස් ස්වාමින් වහන්සේ ඔවුන්ට කතා කළ පසු, ස්වර්ගයට ඔසවාගනු ලැබ, දෙවියන් වහන්සේගේ දකුණු පස අසුන් ගත් සේක. ඔව්හු නික්ම ගොස් සැම තැනම දේශනා කළහ. සමිඳාණන් වහන්සේ ද ඔවුන් සමග ක්‍රියා කරමින්, ඔවුන් අතර සිදු කළ හාස්කම් මගින් ඒ දේශනය සහතික කර වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*